මහජන ආරක්ෂාව භාර අමාත්‍ය ටිරාන් අලස් මානව හිමිකම් කොමිසමට කැඳවීම සම්බන්ධයෙන් ඉරිදා මව්බිම (මාර්තු 12, 2023) සහ මව්බිම (මාර්තු 13, 2023) පුවත්පත් තුළ පළ වූ පුවත් වාර්තාවන් දෙකක සිරස්තල පහත පරිදි වේ.
* ඉරිදා මව්බිම - "මහජන ආරක්ෂක ඇමති මානව හිමිකම් කොමිසමට කැඳවීම දේශපාලන කුමන්ත්‍රණයක්ද?"
* මව්බිම - "මානව හිමිකම් කොමිසමෙන් මහජන ආරක්ෂක ඇමැතිට සිතාසි නිකුත් කර නෑ, කොමිසමේ සභාපතිනිය පැහැදිලි කරයි"
මෙම පුවත් දෙකටම පාදක වන මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් යනු, මව්බිම පුවත්පත අයත් සීමාසහිත සිලෝන් පුවත්පත් (පුද්.) සමාගමේ 49.99% ක සෘජු කොටස් හිමිකාරීත්වය සහිත හිමිකරුවෙකු වේ. ඒ බව , වෙරිටේ රිස(ර්)ච් ආයතනය සහ දේශසීමා නොමැති මාධ්‍යවේදියෝ සංවිධානය එක්ව, ශ්‍රී ලංකාවේ මාධ්‍ය හිමිකාරීත්වයන් සම්බන්ධව පළ කර ඇති Media Ownership Monitor - Sri Lanka 2018 (http://sri-lanka.mom-gmr.org) ඔස්සේ පැවසේ.
මාධ්‍යවේදීන් සිය වෘත්තිය ගෞරවය ආරක්ෂා කිරීමේදී, බැඳියාවන් පිළිබඳ ගැටුම් ඇති වන අවස්ථාවන්ගෙන් වැළකිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පෙන්වා දෙයි.
එසේ නම්, මාධ්‍ය ආයතනයක හිමිකරුවෙකු සම්බන්ධයෙන් වන ප්‍රවෘත්තියක් අදාළ හිමිකාරීත්වය යටතේ පවත්නා මාධ්‍යයක පළ වන අවස්ථාවකදී, එම හිමිකාරීත්වය පිළිබඳ තොරතුරුද මනා විනිවිද භාවයකින් යුතුව පාඨකයා වෙත අනාවරණය කළ යුතු යැයි ඔබ නොසිතන්නේ ද?
මූලාශ්‍ර:
https://assembly.coe.int/.../XRef/X2H-Xref-ViewHTML.asp...
http://sri-lanka.mom-gmr.org
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# මාධ්‍ය හිමිකාරිත්වය සහ පුවත්: බැඳියාවන් අතර ගැටුමක්?

ETHICS EYE

## මහජන ආරක්ෂක ඇමැති මානව හිමිකම් කොමිසමට කැඳවීම දේශපාලන කුමන්ත්‍රණයක්ද?

කොමිසම පෙබරවාරි 28න් පසු රැස්වෙලා නෑ

මානව හිමිකම් කොමිෂන් සභා සාමාජිකයන් සිවුදෙනා මෙම අදහස් පළ කළේ උද්ඝෝෂණ මැඬපැවැත්වීම සඳහා පොලිස් නිලධාරීන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත් පැහැදිලි කරගැනීම සඳහා මහජන ආරක්ෂාව භාර අමාත්‍ය ටිරාන් අලස් මහතා හෙට (13දා) මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවා ඇති බවට පසුගිය 9 වැනිදා එම කොමිසමේ ලිපි ශීර්ෂයෙන් පළ කළ නිවේදනය සම්බන්ධයෙන් කළ විමසීමේදීය.

ඉරිදා මව්බිම 2023-03-12

## මානව හිමිකම් කොමිසමෙන් මහජන ආරක්ෂක ඇමැතිට සිතාසි නිකුත් කර නෑ

කොමිසමේ සභාපතිනිය පැහැදිලි කරයි

එම ඇමැතිවරයාට සිතාසි නිකුත් කළ බවට සංසරණය වන වාර්තා නිවැරදි නොවන බවත් මෙම අවස්ථාවේදී සිතාසි නිකුත් කිරීමක් කර නොමැති බවත් පැහැදිලි කිරීමට මානව හිමිකම් කොමිසම බලාපොරොත්තු වෙයි.

මව්බිම 2023-03-13